# තර්කය හා පරම සත්‍යය

ආනන්ද විජේරත්න

Logic, in the physical world, playing an essential role, helps to draw conclusions regarding the truth value of things or events that have to be observed or have happened on the basis of previous incidents. Even in the religious and philosophical spheres logic helps to clarify concepts to a certain extent that are never experienced. For instance the Upanishads have made use of logic to explain the existence of Brahman: the ultimate reality, to those who have not experienced it before. Contry to the physical world, all attempts made to discern the reality of metaphysical concepts that appear in the religious and the philosophical disciplines through logic have proved inconsequential. The purpose of this essay is to discuss how Buddhism, unlike other teachings, make use of logic to the extent that it would be useful and exceeds logic when it analyses the ultimate reality of Nibana which beyond secular perception.

තාර්කික ව්‍යුහය පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීමේදී ඇගයුම් හා භව්‍යතා අතර වෙනස ප්‍රථමයෙන් අවබෝධ කර ගත යුතුය. ඇරිස්ටෝටලියානු දෙ ඇගයුම් තර්ක ශාස්ත්‍රය ප්‍රමුඛ කොට ගත් අපරදිග තර්ක ශාස්ත්‍රය ප්‍රධාන වශයෙන් ඇගයුම් මුල් කොට ගෙන පවතී. මෙහි ඇගයුම් යනුවෙන් අදහස් කෙරෙනුයේ කිසියම් ප්‍රස්තුතයක සත්‍යාසත්‍යතාව හෝ හරිවැරදි බව හෝ නිර්ණය කිරීමයි. පිළිගත් ස්වසිද්ධි මත අදාළ ප්‍රස්තුතයෙහි සප්‍රමාණ හා නිෂ්ප්‍රමාණතාව නිර්ණය කිරීම ඇගයුමක් වශයෙන් තර්ක ශාස්ත්‍රයේ සැලකේ. මෙහිදී විශේෂයෙන් අවධාරණය කරනු ලබන්නේ අවයව හා නිගමන අතර පවත්නා සංස්ථිතික භාවයයි. භව්‍යතා යනු කිසියම් ප්‍රස්තුතයක් දෙස බැලිය හැකි විවිධ දෘෂ්ටි කෝණයන්ය. කෝටි යනුවෙන් ද මෙම භව්‍යතාවන් හැඳින්වෙයි. භාරතීය තර්ක ශාස්ත්‍රයන්හි ඇගයුම් මෙන් ම-භව්‍යතා ද ඇතුළත්ය. ඒවායේ භව්‍යතාවන්ට වැදගත් ස්ථානයක් හිමිවන අතර අපරදිග චින්තනයෙහි භව්‍යතාවනට වඩා සුවිශේෂ ස්ථානයක් ඇගයුම්වලට හිමි වෙයි. ජෛනයන්ගේ සප්තභඞ්ගි නය භව්‍යතාවනට